# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## දෙවන වාර වැඩ පැවරුම අංක 05 -2020
## පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම්

Name / Index No :......................................................... Grade 3

**2020.05.11 සිට 2020.05.17 සතිය දක්වා පරිසරය වැඩ පොතේ කරවන්න.**

❖ දෙමාපියන් සඳහා උපදෙස්,
- හැකි අය මෙම අභ්‍යාස තනි පැත්තට මුද්‍රණය කර ගැළපෙන ලෙස කොටස් කපා පරිසරය පොතේ අලවන්න.
- හැකි ලෙස දරුවාට පාඩමේ කොටස් පැහැදිළි කර දෙන්න.
- පිළිතුරු පමණක් දරුවාට ලියන්න දෙන්න.
- පිළිතුරු ලැබුණු පසු අකුරු නිවැරදි කරන්න.

## 06- ගෙවත්ත.

**2020.05.11 දින පරිසරය වැඩ පොතේ කරවන්න.**

**❖ නිවස වටා තිබෙන ඉඩමට අපි ගෙවත්ත යැයි කියන්නෙමු.**

01. පහත දේවල්වලින් ඔබගේ ගෙවත්තේ තිබෙන දේවල් යටින් ඉරි අඳින්න.

- වැට හෝ තාප්පය.
- ලිඳ
- ජල කරාම
- වැසිකිළිය
- කාණුව
- මල් පාත්ති
- එළවළු පාත්ති
- ඖෂධ ශාක
- පලතුරු ශාක
- වෙනත් ශාක

( ඉන් කීපයක පින්තූර අඳින්න)

02. ගෙවත්තේ තිබෙන දේවල් වලින් අපට ලැබෙන ප්‍රයෝජන.
- මල් පාත්ති මගින් ගෙවත්ත සුන්දරවීම.
- ගේට්ටුව, වැට හෝ තාප්පය මගින් ගෙවත්තට ආරක්ෂාව ලැබීම.
- කාණුව මගින් ජලය හොඳින් බැස යාම.
- ශාකවලින් අපට ආහාරපාන ලැබීම.
- ඖෂධ ශාකවලින් අපට ඖෂධ ලබා ගත හැකි වීම.
- ලිඳ හා ජලනළ මගින් අපට හා ශාකවලට ජලය ලබාගත හැකි වීම.
- වගා කර ඇති දේවල් විකිණීමෙන් මුදල් ලබාගත හැකිවීම
- අසල්වාසීන්ට ගෙවත්තේ වගා කරඇති දේවල් දීමෙන් සිතට සතුටක් ඇතිවීම.

Richmond College - Grade 3 - 2020

**2020.05.12 දින පරිසරය වැඩ පොතේ කරවන්න.**

03. ගෙවත්තේ තිබෙන දේවල් පිළිවෙළට තිබීමෙන් අපට ලැබෙන ප්‍රයෝජන.

- ගෙවත්ත ඉතා ලස්සන වීම.
- ගෙවත්තේ සුන්දරත්වය නිසා සිතට සතුටත් ලැබීම.
- ගස් වැල්වලට සාත්තු කිරීමට පහසු වීම.
- මල්, ගෙඩි, කරල් වැනි දේවල් කඩා ගැනීමට පහසු වීම.
- ගෙවත්ත නඩත්තුකිරීමේ පහසුව.

04. අපිළිවෙළට ඇති ගෙවත්තක් පිළිවෙළට සකස් කිරීමට කළ හැකි දේවල්.

- භෝග වර්ග අනුව පාත්ති සකස් කිරීම.
- පාත්ති වටා වැටි සකස් කිරීම.
- අවශ්‍ය තැන්වලට තණකොළ පිඩැලි ඇල්ලීම.
- පාත්ති අතර ගමන් කිරීමට ඉඩ තැබීම.
- ජලය ශාකවලට පහසුවෙන් ලබා දීමට කාණු හෝ ජල නළ සැකසීම.

**2020.05.13 දින පරිසරය වැඩ පොතේ කරවන්න.**

**( හොඳින් සකස් කර ඇති ගෙවත්තක් ගැන පහත සඳහන් කරුණු දරුවාට කියා දෙන්න.)**

05. ගෙවත්තේ වගාවන් කර තිබෙන ආකාර.

- පාත්ති ලෙස
- පෝච්චිවල
- ආදේශක බඳුන්වල
- තනි තනි ශාක ලෙස ( පොල්, කොස්, අඹ, පේර වැනි )

06. පැළ සිටුවීමට ගත හැකි ආදේශක බඳුන් වර්ග.

- තරමක් ලොකු ටින්
- හට්ටි
- ප්ලාස්ටික් බෝතල්
- ප්ලාස්ටික් බට, පීලි
- ඉටිකොළ බෑග්
- පෝරඋර
- පොල්ලෙලි බඳුන්
- ලී පෙට්ටි වැනි දේවල්.

( ඉන් කීපයක පින්තූර අඳින්න. ඒවා නම් කරන්න )

07. ගෙවත්තේ වගා කළ හැකි භෝග.

- මල් පැළ
- එළවළු භෝග
- පලතුරු භෝග
- අල වර්ග
- ආහාර රසකාරක භෝග
- ඖෂධ භොග

( මින් කීපයක පින්තූර අලවන්න. ඒවා නම් කරන්න )

Richmond College - Grade 3 – 2020

**2020.05.14 දින පරිසරය වැඩ පොතේ කරවන්න.**

08. ගෙවත්තක් පිරිසිදුව තබා ගැනීමට කළ හැකි දේවල්.
- ඉනිවලින් කොම්පොස්ට් කොටුවක් සෑදීම.
- වල්පැළ නෙළීම.
- ගෙවත්තට හිරු එළිය හොඳින් ලැබීමට සලසීම.
- වතුර රැඳී තිබෙන තැන් ගොඩ කිරීම.
- අනවශ්‍ය දේවල් ඉවත් කිරීම.

09. ගෙවත්තට ජලය ලබා ගන්නා ආකාර.
- ගෙවත්තේඇති ළිඳ මගින්
- කානු මගින්
- ජලනළ මගින්
- මල් බාල්දි මගින්

10. ගෙවත්තේ ඇති සුන්දර බව වැඩි කර ගැනීමට කළ හැකි දේවල්.
- කුඩා පොකුණක් සෑදීම.
- අඹන ලද සත්ත්ව රූප තැබීම.

11. ගෙවත්තේ ඇති භෝග ආරක්ෂා කර ගැනීමට කළ හැකි දේවල්.
- ගෙවත්ත වටා වැටක් තිබීම.
- ටකයක් බැඳ තිබීම.
- දාස් මල් වවා ගිබීම.
- පඹයෙක් සිටුවා තැබීම.
- ඉදල් අතු සිටුවීම.
- සුදු ඉටිකොල එල්ලා තැබීම.
- ගෙඩි හා කරල්වලට ඉටිකොල බෑග් දැමීම.
- පහන් උගුලක් සකසා තැබීම.

( මින් කීපයක පින්තූර අලවන්න. ඒවා නම් කරන්න )

**2020.05.15 දින පරිසරය වැඩ පොතේ කරවන්න.**

<u>භෝග වර්ග පැළ කරගත හැකි ක්‍රම</u>

12. බීජ සිටුවා පැළ ලබා ගැනීම.

මෙහිදී ප්‍රමාණයෙන් ලොකු පහසුවෙන් අතින් ඇල්ලිය හැකි බීජ කෙලින්ම පාත්තිවල හෝ බඳුන්වල සිටුවා පැළ ලබා ගත හැකිය.

උදා- මුං, මෑ, බෝංචි, දඹල, බණ්ඩක්කා, වට්ටක්කා වැනි බීජ

Richmond College - Grade 3 – 2020

13. බීජයකින් පැළයක් ඇතිවන අයුරු සොයා බලමු.

<u>අවශ්‍ය දේවල්-</u>

- විනිවිද පෙනෙන කට ලොකු වීදුරු බෝතලයක්,
- ඉක්මනින් පැළවෙන මුං, බෝංචි හෝ මෑ බීජ කීපයක්,
- පුළුන්
- ජලය

( මෙම ක්‍රියාකාරකම කරන අයුරු ඔබට එවා ඇති වීඩියෝව බලන්න )

ක්‍රියාකාරකම-

- වීදුරු බෝතලයතුලට පුළුන් කට්ටුවක් යොදන්න.
- ඒ මතට මුං හෝ බෝංචි හෝ මෑ බීජ කීපයක් දමන්න.
- පුළුන් තෙමෙන ප්‍රමාණයට පමණක් ජලය ස්වල්පයක් දමන්න.
- දිනෙන් දින බීජවල සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කරන්න. ඒසඳහා අත් කාවයක්ද යොදා ගන්න.

ඉහත පරීක්ෂණයේදී බීජවල පහත දැක්වෙන වෙනස්කම් දරුවන්ට නිරීක්ෂණය කරවන්න.



- පැළ කිරීමට යොදාගත් බීජයේ වර්ණය
- මුලින් ම දක්නට ලැබෙන කොටස
- මුල් ඇදෙන ආකාරය
- මුල් වැඩෙන දිශාව
- කඳ දික්වන ආකාරය
- කඳ වැඩෙන දිශාව
- පත්‍ර හටගන්නා ආකාරය
- එක් එක් කොටසේ පාට වෙනස් වන ආකාරය

Richmond College - Grade 3 – 2020